PR/2022/S 01

# ජපාන තානාපති කාර්යාලය

3 සහ 4 වන මහල්, M2M වැරැන්ඩා කාර්යාලය, අංක 34,
ඩබ්. ඒ. ඩී රාමනායක මාවත, කොළඹ 02, ශ්‍රී ලංකාව
දුරකථනය: +94-11-269-3831 – 3, ෆැක්ස්: +94-11-269-8629
විද්‍යුත් තැපැල: cultujpn@sltnet.lk

2022 ජනවාරි මස 12 වන දින

**<u>පුවත්පත් නිවේදනය</u>**

**<u>ශ්‍රී ලංකාවේ ජපාන තානාපති, අතිගරු මිසුකොෂි හිදෙඅකි මහතා,
තරුණ හා ක්‍රීඩා අමාත්‍ය, සංවර්ධන සම්බන්ධීකරණ හා අධීක්ෂණ අමාත්‍ය
සහ ඩිජිටල් තාක්ෂණ හා ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍ය
ගරු නාමල් රාජපක්ෂ මහතා හමුවෙයි</u>**



2022 ජනවාරි මස 11 වන දින, ශ්‍රී ලංකාවේ ජපාන තානාපති, අතිගරු මිසුකොෂි හිදෙඅකි මහතා සහ තරුණ හා ක්‍රීඩා අමාත්‍ය, සංවර්ධන සම්බන්ධීකරණ හා අධීක්ෂණ අමාත්‍ය සහ ඩිජිටල් තාක්ෂණ හා ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍ය ගරු නාමල් රාජපක්ෂ මහතා අතර සුහද හමුවක් පැවැත්විණි.

අතිශය සාර්ථක අන්දමින් පැවැත්වීමට යෙදුණු ටෝකියෝ 2020 ඔලිම්පික් උළෙල හා පිරිමි හෙල්ල විසිකිරීමේ ඉසව්වෙන් ශ්‍රී ලංකාවට රන් සහ රිදී පදක්කම් දිනා දෙමින් නිමා වූ ටෝකියෝ 2020 පැරාලිම්පික් ක්‍රීඩා උළෙල පිළිබඳව මතකය අළුත් කරගනිමින්, ජපානය හා ශ්‍රී ලංකාව අතර රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පිහිටුවීමේ 70 වන සංවත්සරය සමරමින්,

**PR/2022/S 01**

දෙරට අතර ක්‍රීඩා අන්තර් ක්‍රියාකාරිත්වය තවදුරටත් ශක්තිමත් කරගනිමින් ද්විපාර්ශ්වික සබඳතා වර්ධනය කර ගැනීම පිළිබඳව අමාත්‍ය රාජපක්ෂ මහතා සහ තානාපති මිසුකොෂි මහතා අදහස් හුවමාරු කර ගත්හ.

මෙම වසරේදී 10 වන සංවත්සරය සමරන, ගරු නාමල් රාජපක්ෂ මහතා ප්‍රධාන ආරාධිතයා වශයෙන් සහභාගීවෙමින්, වර්ෂ 2012 දෙසැම්බර් මස විවෘත කිරීමට යෙදුණු, දියගම ශ්‍රී ලංකා - ජපන් මිත්‍රත්ව බේස්බෝල් ක්‍රීඩාංගණයේදී, රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පිහිටුවීමේ 70 වන සංවත්සරය සමරනු වස්, ප්‍රදර්ශණාත්මක බේස්බෝල් තරඟ පැවැත්වීමට ඇති හැකියාව මෙහිදී සාකච්ඡාවට බඳුන් විය.

තරුණ කටයුතු හුවමාරු ක්ෂේත්‍රෙය් විභවතාවය පිළිබඳව අමාත්‍ය රාජපක්ෂ මහතා සහ තානාපති මිසුකොෂි මහතා අදහස් හුවමාරු කර ගත් අතර, වෘත්තීය පුහුණුව සඳහා ජපන් භාෂා පාඨමාලා ලබාදීම තුළින් තරුණ පරපුර අතර මිත්‍රත්වය ප්‍රවර්ධනය කිරීම මෙන්ම, පසුගිය වසර 70 පුරා ජපානය සහ ශ්‍රී ලංකාව අතර අඛණ්ඩව පැවතෙමින් ආ ඓතිහාසික මිත්‍රත්වය හඳුනාගැනීම තුළින් අන්‍යෝන්‍ය අවබෝධය ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන්ද මෙහිදී සාකච්ඡා කරන ලදී.

සංවත්සර වර්ෂයේ ආරම්භයට වඩාත් ගැළපෙන අන්දමින්, සුහද හා සජීවී වටාපිටාවක් තුළ මෙම හමුව පැවැත්විණි.

(සමාප්තයි)

**************************************

වැඩි විස්තර සඳහා කරුණාකර විමසන්න,
සංස්කෘතික අංශය, ජපාන තානාපති කාර්යාලය.
දුරකථන: 011-269-3831 – 3 (දිගු අංකය: 266)